දඹුල්ල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.792,350 ක් වටිනා ශ්‍රවණ උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කර ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ii) | භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය වෙනුවෙන් 2018 වර්ෂයට අදාළ පොලී ආදායම වූ රු.587,700 ක් ඇස්තමේන්තු කර ගිණුම්ගත කර නොතිබුණි. | පොලී ආදායම් ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iii) | 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද යන්ත්‍රෝපකරණ වටිනාකම රු.1,916,949 ක් වුවත් යන්ත්‍රෝපකරණ ගිණුමට රු.478,354 ක් ලෙස දක්වා තිබීමෙන් යන්ත්‍රෝපකරණ වටිනාකම රු.1,438,595 ක් අඩුවෙන් දැක්වේ. | යන්ත්‍රෝපකරණ අඩු වටිනාකම ගිණුම් ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iv) | ව්‍යාපෘති 05 කට අදාළව කර්මාන්ත ණයහිමියන් වශයෙන් රු.2,196,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | දඹුල්ල හෝටල් පුහුණු පාසලේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයට අදාළව ණයහිමියන් රු.480,545 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (vi) | 2018 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා වූ මුද්දර ගාස්තු ආදායම රු.7,154,970 ක් වුවද රු.3,806,920 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මුද්දර ගාස්තු ආදායම හා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.3,348,050 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.51,106,279 ක් වූ ගිණුම් විෂයන් 05 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.91,424,100 ක අසමානතාවයක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | මෙම ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.12,587,598 ක් වූ නමුත් මේ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැළපීම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ගැළපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතු වේ. | සභාව ආරම්භයේ සිටම ගබඩා ලැබීම් ගබඩා ගිණුමට ඇතුළත් කර තිබුණ ද නිකුත් කිරීම් ගිණුමෙන් ඉවත්කර නොතිබීම හේතුවෙන් ගබඩා ශේෂයට අදාළව උපලේඛන පිළියෙල කර නොතිබුණි. එම ගබඩා ශේෂය අවිනිශ්චිත ගිණුම් ලෙස පෙන්වා ඇත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **ලැබිය යුතු ගිණුම්** | | |
| (i) වසර පහකට වැඩි කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.4,005,495 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතු වේ. | සුදුසු පරිදි ශේෂ අයකර ගැනීමට හා අයකරගත නොහැකි ශේෂ කපා හැරීමට අදාළ කටයුතු ඉටුකරමින් පවතී. |
| (ii) සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.722,552 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක වටිනාකම වසර පහකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | මෙම ශේෂයන් නිරවුල් කිරීමට හා සුදුසු පරිදි කපාහැරීමට කටයුතු කරමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.73,108,172 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | | | |
| i. රීති (71) | ප්‍රදේශයේ ත්‍රීවීල් රථ සඳහා පී.එස්.27 ආකෘතිපත්‍රය ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි. | පී.එස්.27 ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | පී.එස්.27 ආකෘති පත්‍රය ප්‍රකාර ලේඛනයක් 2019 වර්ෂයේ සිට පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | රීති (217) | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පී.එස්.46 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | පී.එස්.46 ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | පී.එස් 46 ලේඛනය 2019 වර්ෂයේ සිට පවත්වාගෙන යාමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්මවූ කර්මාන්ත අතරැදි මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉකුත් තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රජයේ ආයතනවල රක්ෂණාවරණය ලබාගැනීමේදී තරඟකාරීව මිල ගණන් කැඳවා රක්ෂණාවරණ ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයට රක්ෂණය කිරීමේදී මිල ගණන් කැඳවා රක්ෂණය කිරීමට කටයුතු කරමි. |

2 මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අදායම රු.26,149,682 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,139,149 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---:|---:|---:|---:|---:|---:|---:|---:|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,376,000 | 2,812,000 | 2,629,200 | 182,800 | 2,540,000 | 2,734,900 | 2,555,300 | 179,600 |
| කුලී | 2,300,000 | 2,315,000 | 2,317,060 | 1,032,099 | 1,717,500 | 2,070,000 | 1,926,666 | 1,187,493 |
| බලපත්‍ර ගාස්තු | 17,050,850 | 17,339,150 | 17,001,898 | 337,251 | 14,350,000 | 16,099,792 | 15,186,165 | 922,026 |
| වෙනත් ආදායම් | 503,550 | 327,500 | 246,500 | 81,000 | 175,000 | 153,000 | 445,050 | 25,800 |
| එකතුව | 23,230,400 | 22,793,650 | 22,194,658 | 1,633,150 | 18,782,500 | 21,057,692 | 20,113,181 | 2,314,919 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදී ත්‍රීරෝද රථ 131 කින් රු.91,700 ක ආදායමක් අයකර නොතිබුණි. | ත්‍රීරෝද රථ හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන හා ප්‍රමාණයන් පිළිබඳව ඇති ගැටලු තත්ත්වයන් නිරවුල් කර අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 නොවැම්බර් 31 වන විටත් හෝටල් 02 කින් 2018 වර්ෂය සඳහා ව්‍යාපාරික බදු අයකර නොතිබුණි. | හිඟ ව්‍යාපාරික බදු අයකර ගත යුතු වේ. | අදාළ හෝටල්වලින් මුදල් වාර්තා පැමිණි පසු අය කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සීගිරිය රථගාල කුලියට දීම සම්බන්ධයෙන් වසර ගණනාවක සිට අයවීමට තිබෙන හිඟ කුලී මුදල රු.1,044,160 ක් විය. | හිඟ කුලී අයකර ගත යුතු වේ. | මෙම කුලිය සම්බන්ධයෙන් දඹුල්ල මහ අධිකරණයේ නඩුවක් ගොනුකර ඇත. |

### 2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ව්‍යාපාර බලපත්‍ර ගාස්තුව රු.189,251 ක් හා පරිසර බලපත්‍ර ගාස්තුව 148,000 ක් විය. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගත යුතු වේ. | මෙම මුදල් අය කර ගැනීම සඳහා අදාළ ආයතනය දැනුවත් කර ඇත. |

2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ ත්‍රීරෝද රථ නැවතුම්පළ කුලී රු.81,000 ක් හිඟව පැවතුණි. | හිඟ ත්‍රීරෝද රථ නැවතුම්පළ කුලි අයකර ගත යුතු වේ. | ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන හා ප්‍රමාණයන් පිළිබඳව ඇති ගැටලු තත්ත්වයන් නිරවුල් කර අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 වන විටත් කාරණා 19 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සම්බන්ධයෙන් කඩිනමින් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම කළ යුතු වේ.. | මේ වන විට අතුරු ව්‍යවස්ථා පනවා නැති කාරණා සම්බන්ධයෙන් ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඉලක්ක කරා ළඟාවීම කළ යුතු වේ. | මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ලේඛනයෙන් සලසා නොතිබුණු අතර ඉදිරියේදී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කැබ් රථයක් අනතුරට පත්වීම සම්බන්ධයෙන් මු.රෙ 104(1)(අ) ප්‍රකාරව කටයුතු කර අනතුරට අදාළ වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකර ගත යුතු වේ. | ඉදිරියේදී අදාළ පරීක්ෂණය සිදු කිරීමට කටයුතු කරමි. |
| (ආ) අනතුරට පත්වූ බැකෝලෝඩරය ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ) පරිදි කටයුතු කර නොතිබුණු අතර රක්ෂණ ආයතනයෙන් රු.50,000 ක වන්දි මුදලක් ලැබී තිබුණු නමුත් අලුත්වැඩියා කර නොතිබුණි. | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගත යුතුවේ. | අදාළ කටයුත්ත හැකි ඉක්මනින් ඉටු කරමි. |
| (ඇ) දඹුල්ල දිසා අධිකරණයේ MR-226 දරන නඩු තීන්දුව ප්‍රකාරව සභා අරමුදලින් රු.292,069 ක ගෙවීමට සිදුවීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකර ගත යුතු වේ. | සිදුවූ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් ආරම්භ කර ඇත. |
| (ඈ) 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් අනාවරණය කරගත් රු.389,195 ක් වටිනා භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අලාභයට වගකිව යුත්තන් හඳුනාගෙන අලාභය අයකර ගත යුතු වේ. | ඌන භාණ්ඩ සම්බන්ධයෙන් වගකිව යුත්තන් තීරණය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 10 ක පුරප්පාඩු 19 ක් විය. | පුරප්පාඩු සපුරා ගත යුතු වේ. | දක්වා ඇති තනතුරුවලට බඳවා ගැනීමට මේ වන විටත් කටයුතු යොදා ඇත. |

(ආ) ස්ථිර නොකළ කාර්ය මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| | තනතුරු 05 කට අයත් සේවකයින් 08 දෙනෙකු පත්වීම් ලබා වර්ෂ 05 කට අධික කාලයක් ගතව තිබුණද සේවා ව්‍යවස්ථාවට අදාළ සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් ස්ථිර කර නොතිබුණි. | සුදුසු පරිදි ස්ථිර කර ගත යුතු වේ. | අදාළ සේවකයන් ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

(ඇ) සේවක ණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු එකතු ණය ශේෂය රු.199,129 ක් විය. | සේවක ණය අයකර ගත යුතු වේ. | මෙම ණය මුදල් අයකර ගැනීම සඳහා අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත් කරමි. |
| (ii) | දිර්ඝ කාලයක සිට අයවීමට ඇති සේවකයින් 10 දෙනෙකුට අයත් රු.32,847 ක් වූ ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | සේවක ණය අයකර ගත යුතු වේ. | මෙම ණය මුදල් අය කර ගැනීම සඳහා එම සේවක මහතුන් දැනුවත් කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.2,500,000 ක් වටිනාකමැති කැබ් රථයක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීම කළ යුතු වේ. | මෙම වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කරමි. |

3.4.2 නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු බ්ලොක් ගල් යන්ත්‍රයක්, කැබ් රථ දෙකක්, යතුරු පැදියක්, කසළ ටේලරයක් හා මහේන්ද්‍රා කැබ් රථයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට නොගන්නා වත්කම් අපහරණය කළ යුතු වේ. | මෙම යන්ත්‍ර සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන හා ප්‍රාදේශීය සභා අරමුදල් යොදා රු.7,982,385 ක වටිනාකමකට නිමකර තිබුණු මහජන පුස්තකාල ගොඩනැගිලි 03 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසාදමා තිබුණි. | මහජන ප්‍රයෝජනයට විවෘත කළ යුතු වේ. | මෙම පුස්තකාල ගොඩනැගිලි හැකි ඉක්මනින් ජනතා අයිතියට පත්කිරීමට කටයුතු කරමි. |

3.5 දෘශ්‍ය අක්‍රමිකතා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ----------- | -------------------------- |
| සභාව සතු ලොරි රථයක් 2018 දෙසැම්බර් 05 දින ඉන්ධන පරික්ෂා කිරීමේදී එදිනට වාහනය භාරව කටයුතු කළ රියදුරු විසින් සිදුකරන ලද ඉන්ධන අවභාවිතය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදුකර නීත්‍යානුකූලව කටයුතු කරමි. |